# අධිකරණ සේවා කොමිෂන් සභාව

## උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් තනතුර සඳහා බඳවා ගැනීම - 2021

අංක 2088/26 දරන 2018.09.11 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවා ව්‍යවස්ථාවෙහි දක්වා ඇති විධිවිධානයන්ට අනුව උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් තනතුරට බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවීම සඳහා දැන්වීමක් 2021.05.13 දින හා අංක 2228 දරන *ගැසට් පත්‍රයේ* පළකරන ලද අතර ඒ සඳහා අයදුම්පත්‍ර භාරගන්නා අවසන් දිනය දැනට බලාත්මක සංචරණ සීමා සැලකිල්ලට ගෙන දීර්ඝ කිරීමට අධිකරණ සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත.

02. ඒ අනුව එම නිවේදනයේ 10 ඡේදය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

(අ) අයදුම්පත්‍ර ගාස්තුව රු. 500කි. මෙම මුදල ''අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්'' නමින් මහජන බැංකුව, වෙල්ල වීදිය ශාඛාවේ පවත්වාගෙන යනු ලබන ගිණුම් අංක 297100199025039ට බැර වන සේ ඕනෑම මහජන බැංකු ශාඛාවකින් මුදල් ගෙවා ලබාගත් ලදුපත අයදුම්කරුගේ නම ලිපිනය ලියන ලද 9X4 ප්‍රමාණයේ ලියුම් කවරයක් සමග ලියාපදිංචි තැපැල් මගින් අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයට ලැබීමට සැලැස්වීමෙන් හෝ පෞද්ගලිකව පැමිණ භාරදීමෙන් අයදුම්පත ලබාගත හැකිය. එසේ නැතහොත් මෙම නිවේදනයේ සඳහන් ආකෘති පත්‍රයට අනුව සකස් කරන ලද අයදුම්පත්‍රයක් සම්පූර්ණ කර එයට මුදල් ගෙවා ලබාගත් ලදුපත අලවා ඉදිරිපත් කිරීමද කළ හැකි වේ.

(ආ) සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2021.07.09 දින හෝ ඊට පෙර ලැබෙන පිණිස ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය, කොළඹ 12 යන ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් හෝ අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය වෙත පෞද්ගලිකව පැමිණ අයදුම්කරුවන් විසින් සිය අයදුම්පත ඉදිරිපත් කළ යුතුය.

03. නිවේදනයේ සඳහන් අනෙකුත් කරුණු නොවෙනස්ව පවතී.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

එච්. එස්. සෝමරත්න,
ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2021 ජුනි මස 17 වැනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.